සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2020 ජනවාරි

## (AA11) මූල්‍ය ගිණුම්කරණ මූලිකයන්

(Financial Accounting Basics)

2020-01-25
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ **නොහැකි** ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

අනිවාර්ය ප්‍රශ්න පහළොව (15) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.8 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, මූල්‍ය ප්‍රකාශන භාවිත කරනු ලබන පාර්ශවයන් වන්නේ:

(1) අයිතිකරුවන්ය. (2) සේවකයන්ය.
(3) ආයෝජකයන්ය. (4) ඉහත සඳහන් සියල්ලමය. (ලකුණු 02)

**1.2** අයභාරය (ආදායම) මුදලින් ලැබුණේද නැද්ද නොසළකා, කිසියම් ගිණුම් කාලපරිච්ඡේදයට අදාල අයභාරය හඳුනාගනු ලබයි. මෙයට අදාලවන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) අඛණ්ඩ පැවැත්ම (Going Concern) සංකල්පයයි.
(2) උපචිත (Accrual) සංකල්පයයි.
(3) මූල්‍ය මිනුම් (Money Measurement) සංකල්පයයි.
(4) අස්තිත්ත්ව (Entity) සංකල්පයයි. (ලකුණු 02)

1.3 ව්‍යාපාරයේ ගබඩාව තුළ සමහර තොග අයිතමයන් නොමැති බව, **සීනා ට්‍රේඩර්ස්හි** අළුතින් පත්කරන ලද ගබඩා භාරකරු වන **පෙරේරා** විසින් නිරීක්ෂණය කරන ලදී.

අවශ්‍ය කරන ලබන තොග අයිතමයන් ලබා ගැනීම සඳහා මිලදී ගැනීමේ දෙපාර්තමේන්තුව වෙත ඉල්ලුම් කිරීමට, **පෙරේරා** විසින් භාවිත කරන මූලාශ්‍ර ලියවිල්ල වන්නේ පහත සඳහන් ඒවා අතුරෙන්, කුමක් ද?

(1) ගැනුම් ඇණවුම [Purchase Order (PO)].

(2) ජර්නල් වවුචරය [Journal Voucher (JV)].

(3) භාණ්ඩ ලැබීමේ පත්‍රිකාව [Goods Received Note (GRN)].

(4) ද්‍රව්‍ය අධියාචනා පත්‍රය [Material Requisition Note (MRN)]. (ලකුණු 02)

1.4

| වත්කම් | = | ස්කන්ධය (හිමිකම) | + | වගකීම් |
|---|---|---|---|---|
| 150,000<br>(140,000) | = | 150,000<br>(140,000) | + | - |

පහත සඳහන් ඒවා අතුරෙන්, ඉහත ගිණුම්කරණ සමීකරණය සඳහා වඩාත් නිවැරදි ගනුදෙනුව වන්නේ කුමක් ද?

(1) පිරිවැය රු.140,000/- ක් වූ භාණ්ඩ රු.150,000/- කට විකුණන ලදී.

(2) පිරිවැය රු.150,000/- ක් වූ භාණ්ඩ රු.140,000/- කට විකුණන ලදී.

(3) රු.150,000/- ක භාණ්ඩ, ණය පදනම මත විකුණා රු.140,000/- ක මුදලක් එකතු කරගන්නා ලදී.

(4) රු.150,000/- ක භාණ්ඩ, ණය පදනම මත මිලදීගෙන රු.140,000/- ක් ගෙවන ලදී.
(ලකුණු 02)

1.5 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සරසි ට්‍රේඩර්ස්හි** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

| විස්තරය | රු. |
|---|---|
| 2018 අප්‍රේල් 01 දිනට ශුද්ධ වත්කම් | 975,000 |
| 2019 මාර්තු 31 දිනට ශුද්ධ වත්කම් | 1,350,000 |
| වර්ෂය තුළදී අයිතිකරු විසින් හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය | 500,000 |
| වර්ෂය තුළදී අයිතිකරු විසින් සිදුකළ ගැනිලි | 350,000 |

ඉහත සඳහන් තොරතුරු අනුව, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ලාභය වන්නේ:

(1) රු.525,000/-. (2) රු.225,000/-. (3) රු.1,475,000/-. (4) රු.375,000/-.
(ලකුණු 02)

1.6 සාම්ප්‍රදායික ගිණුම් වර්ගීකරණය යටතේ මූර්ත ගිණුමක් (real account) සඳහා උදාහරණයක් වන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) ණයගැතියන්ගේ ගිණුම. (2) විකුණුම් ගිණුම.

(3) ණය පොලී ගිණුම. (4) යන්ත්‍ර ගිණුම. (ලකුණු 02)

**1.7** විශේෂිත (customized) ගිණුම්කරණ මෘදුකාංගයක් සඳහා උදාහරණයක් වන්නේ:

(1) ඇක්පැක් (ACCPAC). (2) කිවික් බුක් (Quick Book).

(3) වැටුප් ලේඛන පද්ධතිය (Payroll System). (4) ටැලි (Tally). (ලකුණු 02)

**1.8** පහත සඳහන් ගනුදෙනු අතුරෙන්, වත්කම් වැඩිවීමට බලපාන ගනුදෙනුවක් වන්නේ කුමක් ද?

(1) ව්‍යාපාරයේ අයිතිකරු විසින් අමතර ප්‍රාග්ධනය ලෙස රු. මිලියන 1.5 ක මුදලක් ආයෝජනය කිරීම.

(2) මාර්තු මාසයට අදාල රු.75,000/- ක ජල බිල්පත ගෙවා තිබීම.

(3) වෙළෙඳ ණයගැතියෙකුගෙන් රු.100,000/- ක මුදලක් ලැබීම.

(4) වෙළෙඳ ණයහිමියෙකුට රු.125,000/- ක මුදලක් පියවීම. (ලකුණු 02)

*අංක **1.9** සිට **1.15** දක්වා ප්‍රශ්නවලට නිවැරදි උත්තර, ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.9** කේවලස්වාමි ව්‍යාපාරයක මූල්‍ය කාර්යසාධනයට සෘජුවම සම්බන්ධවන මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග දෙක(02) සඳහන් කරන්න. (ලකුණු 02)

**1.10** "ගිණුම්කරණ කාලච්ඡේද සංකල්පය" කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

**1.11** **ABC ට්‍රේඩර්ස් හි** පහත සඳහන් එක් එක් ගනුදෙනුව වාර්තා කිරීමට භාවිත කරනු ලබන "මූලාශ්‍ර ලේඛනය" (Source Document) හඳුනා දක්වන්න:

**(a)** ගනුදෙනුකරුවෙක් විසින් රු.465,000/- ක මුදලකට ණය පදනම මත මිලදී ගන්නා ලද අයිතම, අඩු ගුණාත්වය නිසා ඔහු විසින් ආපසු එවා තිබේ.

**(b)** ව්‍යාපාරයේ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා රු.2,500,000/- කට ලොරි රථයක් ණය පදනම මත මිලදී ගන්නා ලදී.

**(c)** වෙළෙඳ ණයගැතියෙකුගෙන් රු.25,000/- ක මුදලක් ලැබීම. (ලකුණු 03)

**1.12** 2018 අප්‍රේල් 01 දින **ප්‍රියන්ත ස්ටෝර්ස්** විසින් රු.1,250,000/- ක මුදලකට යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී. යන්ත්‍රයේ ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය වර්ෂ 5 ක් වන අතර, ඵලදායී ජීව කාලය අවසානයේදී එහි ඇස්තමේන්තුගත අවශේෂ වටිනාකම රු.250,000/- කි. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත ක්ෂය ප්‍රතිපාදනය කිරීමයි.

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රයේ ක්ෂය ගණනය කරන්න. (ලකුණු 03)

**1.13** පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක (Computerized Accounting System) වාසි තුනක්(03) ලැයිස්තුගත කරන්න. (ලකුණු 03)

**1.14** පහත සඳහන් එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍ය** යන්න සඳහන් කරන්න. උත්තරය (සත්‍ය හෝ අසත්‍ය) යන්න ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න:

**(a)** අයිතිකරු විසින් සිදුකරනු ලබන ගැනිලි, ස්කන්ධය (හිමිකම) වැඩිවීමට බලපානු ලබයි.

**(b)** ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වනු ලබන සියලුම පාර්ශවයන් ව්‍යාපාරයේ කළමනාකරණ ගිණුම් වාර්තා භාවිත කරනු ලබයි.

**(c)** ප්‍රමාණාත්මක බවේ සංකල්පය අනුව, ප්‍රමාණාත්මක අයිතම මූල්‍ය ප්‍රකාශනවල වෙනමම හෙළිදරව් කළ යුතුය.

**(d)** වගකීමක නිර්ණායකයක් වන්නේ ව්‍යාපාරයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමයි. (ලකුණු 04)

**1.15** **රෝමා ට්‍රේඩර්ස්හි** 2019 මාර්තු මාසය තුළ සිදුකරන ලද පහත සඳහන් එක් එක් ගනුදෙනුව සඳහා වන නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න:

(a) සාප්පුව අළුත්වැඩියා කිරීම සඳහා බැංකුවෙන් රු.500,000/- ක ණය මුදලක් ලබා ගන්නා ලදී.

(b) රු.25,000/- ක පොලී ආදායම, බැංකු ගිණුමට ලැබී තිබුණි.

(c) අයිතිකරු, ඔහුගේ පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ රු.15,000/- ක විදුලි බිලක් ගෙවන ලදී. (ලකුණු 06)

(මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

**ප්‍රවීන්,** රු.2,500,000/- ක මුදලක් ආයෝජනය කර, බැංකු ගිණුමක් විවෘතකොට 2018 අප්‍රේල් 01 දින **ප්‍රවීන් ට්‍රේඩර්ස්** නම් වූ කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

(1) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදුකළ මුදල් ගනුදෙනු පහත සඳහන් පරිදි වේ:

| **මුදල් ලැබීම්** | **රු.** |
|---|---|
| **ප්‍රවීන්** විසින් හඳුන්වා දුන් ප්‍රාග්ධනය | 2,500,000 |
| මුදලට විකුණුම් | 1,300,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 831,000 |
| | **4,631,000** |

| **මුදල් ගෙවීම්** | **රු.** |
|---|---|
| මෝටර් ලොරි රථය (2018 ඔක්තෝම්බර් 01 දින අත්පත් කරගත්) | 1,500,000 |
| වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 1,150,000 |
| විදුලිය | 72,000 |
| වැටුප් සහ වේතන | 290,000 |
| ගැනිලි | 175,000 |
| මුදලට ගැනුම් | 788,000 |
| | **3,975,000** |

(2) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ මෝටර් ලොරි රථය මත ක්ෂය, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට වර්ෂයකට 25% ක් ප්‍රතිපාදනය කිරීමයි:

(3) 2019 මාර්තු 31 දිනට ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ පහත පරිදි වේ:

| | **රු.** |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 145,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 110,000 |
| ගෙවිය යුතු වැටුප් | 38,000 |

(4) 2019 මාර්තු 31 දිනට කිසිදු තොගයක් නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 මාර්තු 31 දිනට **ප්‍රවීන් ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම **පිළියෙළ කරන්න.** (ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

විදුලි අයිතම නිෂ්පාදන ආයතනයක් වන **"සමනල ට්‍රේඩර්ස්"** හි, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට පහත සඳහන් තොරතුරු අදාල වේ:

| | **රු.** |
|---|---|
| තොග: | |
| 2018 අප්‍රේල් 01 දිනට අමු ද්‍රව්‍ය | 3,400,000 |
| 2019 මාර්තු 31 දිනට අමු ද්‍රව්‍ය | 2,100,000 |
| 2018 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 825,000 |
| 2019 මාර්තු 31 දිනට නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 1,250,000 |
| අමුද්‍රව්‍ය මිලදී ගැනීම් | 3,200,000 |
| කම්හල් කළමනාකරුගේ වැටුප | 675,000 |
| විදුලිය වියදම් | 600,000 |
| ආරක්ෂණ වියදම් | 400,000 |
| ගෙනඒමේ කුලී - අමුද්‍රව්‍ය | 120,000 |
| ඍජු වැටුප් - නිෂ්පාදන කම්කරුවන් | 1,200,000 |
| කම්හල් යන්ත්‍ර මත ක්ෂය | 500,000 |
| කම්හල් කුලිය | 1,100,000 |
| කම්හල් යන්ත්‍ර මත නඩත්තු වියදම් | 110,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) පහත සඳහන් වියදම් පහත පරිදි බෙදා වෙන්කළ යුතුය:

| **වියදම්** | **කම්හල** | **කාර්යාලය** |
|---|---|---|
| විදුලිය වියදම් | 70% | 30% |
| ආරක්ෂණ වියදම් | 60% | 40% |

(2) නිෂ්පාදන කම්කරුවන්, ඍජු වේතනයට අමතරව නිෂ්පාදනය කරනු ලබන එක් එක් අයිතමය වෙනුවෙන් රු.200/- ක දීමනාවකට හිමිකම් කියනු ලබයි.

(3) වර්ෂය තුළදී නිෂ්පාදනය කරන ලද මුළු අයිතම ප්‍රමාණය ඒකක 2,500 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සමනල ට්‍රේඩර්ස්** හි නිෂ්පාදන ගිණුම **පිළියෙල කරන්න**. (ලකුණු 08)

(b) අයිතමයක නිෂ්පාදන පිරිවැය **ගණනය කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**ජනසෙත ට්‍රේඩර්ස්** හි 2019 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම එකඟ නොවූ අතර, වෙනස වූ රු.43,000/- අවිනිශ්චිත ගිණුමකට බැර කරන ලදී.

පහත දැක්වෙන වැරදි පසුව හඳුනාගන්නා ලදී:

(1) නැවත විකිණීම සඳහා රු.68,900/- ක අත්පිට මුදලට මිලදී ගැනීම්, ගැනුම් ගිණුමේ රු.86,900/- ක් ලෙස සටහන් කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(2) රු.33,600/- ක යන්ත්‍ර නඩත්තු වියදම, යන්ත්‍ර ගිණුමට හර කර තිබුණි.

(3) අයිතිකරු විසින් හඳුන්වා දුන් රු.165,000/- ක අතිරේක ප්‍රාග්ධනය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණු නමුත් එය වැරදි ලෙස වෙළෙඳ ණයහිමි ගිණුමට බැර කර තිබුණි.

(4) රු.21,000/- ක ලැබූ කුලී ආදායම, ගිණුම් පොත්වලින් සම්පූර්ණයෙන් මගහැරී තිබුණි.

(5) රු.98,000/- ක් වූ කුලී වියදම්, කුලී වියදම් ගිණුමට දෙවරක් හර කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(6) වෙළෙඳ ණයහිමියෙකුට ගෙවූ රු.109,000/- ක මුදලක්, මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණු නමුත් එය වෙළෙඳ ණයහිමි ගිණුමෙහි සටහන් කර නොතිබුණි.

(7) රු.73,900/- ක අත්පිට විකුණුම්, මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇති අතර, එය විකුණුම් ගිණුමේ සටහන් කර තිබෙන්නේ රු.37,900/- ක් ලෙසයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(b) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(a) කේවලස්වාමි ව්‍යාපාරයක් වන **ප්‍රනාන්දු ස්ටෝර්ස් හි** පොත්වලින් 2019 මාර්තු මාසයට අදාළ පහත සඳහන් ගනුදෙනු උපුටාගන්නා ලදී:

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2019.03.01 | නැවත විකිණීම සඳහා රු.825,000/- ක් වටිනා භාණ්ඩ ණය පදනම මත මිලදී ගන්නා ලදී. |
| 2019.03.05 | පිරිවැය රු.420,000/- ක් වූ භාණ්ඩ, රු.525,000/- කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 2019.03.15 | **ප්‍රනාන්දු** විසින් තම පෞද්ගලික වියදම් සඳහා රු.75,000/- ක මුදලක් ලබා ගන්නා ලදී. |
| 2019.03.26 | ණය පදනම යටතේ මිලදී ගත් භාණ්ඩ සඳහා ණයහිමියන්ට රු.95,000/- ක් ගෙවන ලදී. |
| 2019.03.30 | රු.100,000/- ක කාර්ය මණ්ඩල වැටුප් ගෙවන ලදී. |
| 2019.03.31 | කාර්යාල ප්‍රයෝජනය සඳහා රු.1,500,000/- ක් වටිනා ලී බඩු, ණය පදනම මත මිලදී ගන්නා ලදී. |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සටහන් කරන්න**.

[ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්) + තොග + මුදල් = ස්කන්ධය (හිමිකම) + වගකීම්] (ලකුණු 06)

(b) කේවලස්වාමි ව්‍යාපාරයක් වන **සමරවීර ට්‍රේඩර්ස්හි** පොත්වලින් 2019 මාර්තු 31 දිනෙන් අවසන් මාසය සඳහා පහත සඳහන් ගනුදෙනු උපුටාගන්නා ලදී:

(1) 2019 මාර්තු 01 දින, ව්‍යාපාරයේ අයිතිකරු වන **සමරවීර** විසින්, රු.750,000/- ක් වටිනා තම පෞද්ගලික මෝටර් රථය ව්‍යාපාරය වෙත පවරා දෙන ලදී.

(2) 2019 මාර්තු 15 දින, යන්ත්‍රයක් රු.250,000/- කට **සීමාසහිත XY සමාගමෙන්** ණය පදනම මත මිලදී ගන්නා ලදී.

(3) රු.25,000/- ක විදුලි බිල්පතක්, දුරකතන වියදම් ගිණුමට හර කර ඇති අතර, එයට අදාළ අනෙක් සටහන නිවැරදිව සටහන් කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ගනුදෙනු වාර්තා කිරීම සඳහා පොදු ජර්නලය **පිළියෙල කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න එක (01) කි.

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**KPM ට්‍රේඩර්ස්** යනු **සැම් සිල්වාට** අයත් තනි ව්‍යාපාරයකි. 2019 මාර්තු 31 දිනට, **KPM ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම පහත දැක්වේ:

**KPM ට්‍රේඩර්ස්**

**2019 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට: | | |
| ඉඩම සහ ගොඩනැගිලි (ඉඩම රු.3,000,000/-) | 8,000 | |
| මෝටර් වාහන | 2,200 | |
| කාර්යාල උපකරණ | 1,100 | |
| 2018 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 1,200 |
| මෝටර් වාහන | | 400 |
| කාර්යාල උපකරණ | | 225 |
| 2018 අප්‍රේල් 01 දිනට තොග | 1,800 | |
| විකුණුම් | | 25,200 |
| ගැනුම් | 15,500 | |
| විදුලිය | 1,200 | |
| ජලය | 350 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 2,800 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 1,900 |
| ලිපි ද්‍රව්‍ය | 150 | |
| වැටුප් සහ වේතන | 1,250 | |
| ගෙවූ වරිපනම් | 180 | |
| බැංකු ණය | | 900 |
| බැංකු අයිරාව | | 1,350 |
| 2018 අප්‍රේල් 01 දිනට අඩමාණ ණය සඳහා වෙන්කිරීම | | 170 |
| බැංකු අයිරා පොලිය | 110 | |
| 2018 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | | 3,295 |
| | **34,640** | **34,640** |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2019 මාර්තු 31 දිනට අවසාන තොගය, පිරිවැයට, රු.1,850,000/- කට අගය කරන ලදී.

(2) පහත පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය ප්‍රතිපාදනය කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | 10% |
| මෝටර් වාහන | : | 20% |
| කාර්යාල උපකරණ | : | 25 % |

(3) වෙළෙඳ ලැබිය යුතු මුදල්වලින් රු.100,000/- ක මුදලක් බොල් ණය ලෙස කපා හැරීමටත්, 2019 මාර්තු 31 දිනට ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල්වලින් අඩමාන ණය සඳහා 10% ක පොදු ප්‍රතිපාදනයක් කිරීමටත් කළමනාකාරිත්වය තීරණය කරන ලදී.

(4) 2019 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු විදුලිය වූ රු.143,000/-, ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.

(5) 2019 මාර්තු 01 දින, 12% ක වාර්ෂික පොලී අනුපාතිකයකට, බැංකු ණය මුදලක් ලබාගෙන තිබුණි. ණය මුදලේ පළමු වාරිකය 2019 අප්‍රේල් 02 දින ගෙවා තිබූ අතර, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ පොලිය පොත්වල ගිණුම් ගත කර නොතිබුණි.

(6) ගෙවූ වරිපනම් 2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලයට අදාළ වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැළකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැළැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |